**12-11-2024** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, හොඳම සැරසිල්ල වන පාරිශුද්ධත්වයෙන්, ඔබව සැරසවීමට පියා පැමිණ සිටිනවා.

**ප්‍රශ්නය:** සම්පූර්ණ උපත් 84 ගන්නා අයගේ ප්‍රධාන සලකුණු මොනවාද?

**පිළිතුර:** 1) පියාව සිහි කිරීම සමඟම ඔවුන් ගුරුවරයා සහ සත්ගුරුවද සිහිකරයි ඔවුන් තිදෙනාවම සිහි කරයි. ඔවුන් පියාව සිහිකර, ගුරුවරයාව අමතක කරන්නේ නැහැ. ඔවුන් තිදෙනාවම සිහි කරන විට පමණයි, ඔවුන්ට ක්‍රිෂ්ණාගේ දේශයට යාමට, එනම් ආරම්භයේ සිටම තම චරිත කොටස් රඟපෑමට හැකි වන්නේ. 2) ඔවුන් කිසිම විටෙක මායාගේ කුණාටු වලින් පරාජය නොවෙයි.

ඕම් ශාන්ති. පියා ප්‍රථමයෙන්ම ඔය දරුවන්ගෙන් විමසන්නේ ඔබ අසුන්ගෙන සිටින්නේ පියා, ගුරුවරයා සහ සත්ගුරු ඉදිරියේ බව, ඔබට අමතක වෙන්නේ නැහැ නේද? මෙතැන අසුන්ගෙන සිටින සියලු දෙනාටම මෙම අවධානය නොමැති බව, බාබාට සිතෙයි. කෙසේවෙතත් ඔබට විස්තර කිරීම බාබාගේ වගකීමයි. ඔහුව වැටහීමෙන් යුතුව සිහිකිරීමේ අරුත මෙයයි. අපගේ බාබා අසීමිත පියා සහ ගුරුවරයාය, එමෙන්ම ඔහු නියත වශයෙන්ම සත්ගුරුය, දරුවන් වන අපව, ඔහුත් සමඟ ආපසු ගෙන යන, ඒකායන කෙනාය. පියා මෙහි පැමිණ සිටින්නේ ඔය දරුවන්ව සැරසවීමටයි. ඔහු දිගින් දිගටම ඔබව පිවිතුරු බවින් සරසවන අතර ඔබට අසීමිත ධනයද ලබා දෙයි. ඔබ යා යුතු නව ලෝකයට, ඔහු ඔබට ධනය ලබා දෙයි. ඔය දරුවන් මෙය මතකයේ තබා ගත යුතුයි. සමහර දරුවන් නොසැලකිලිමත් වන බැවින් ඔවුන්ට තිබිය යුතු සම්පූර්ණ සතුට අඩුවෙයි. මෙවන් පියෙක් ඔබට වෙනත් කිසිම තැනක හමු නොවෙයි. ඔබ නියත වශයෙන්ම බාබාගේ දරුවන් බවත් ඔහු ඔබට උගන්වන බවත්, ඔබ දන්නවා. ඔහු ගුරුවරයාද වන්නේ මේ නිසයි. ඔබගේ අධ්‍යයනය, නව ලෝකය, අමරණීය දේශය වෙනුවෙනි. ඔබ දැන් අසුන්ගෙන සිටින්නේ සංගම යුගයේය. ඔය දරුවන් මෙය අනිවාර්යෙන් සිහි කළ යුතුයි. ඔබ මෙය ස්ථිරව මතකයේ තබා ගත යුතුයි. ඔබ මෙකල සිටින්නේ රකුසු ලෝකයේ, කාන්ස්ගේ දේශයේ බවද ඔබට වැටහෙනවා. සමහරුන්ට දර්ශන ලැබුණත්, එමගින් ඔවුන්ට ක්‍රිෂ්ණාගේ දේශයට හෝ ඔහුගේ රජ පෙලපතට යාමට හැකි වන්නේ නැහැ. ඔවුන් නොකඩවා පියා, ගුරුවරයා සහ සත්ගුරු - තිදෙනාම ජ් සිහිකළ විටයි, ඔවුන්ට එහි යාමට හැකි වන්නේ. බාබා ඔය ජීවාත්මයන්ට මෙය පවසයි. ඔය ජීවාත්ම පිළිතුරු දෙන්නේ ඔව් බාබා! බාබා ඔබ අපට සත්‍යය පවසනවා. ඔබ පියා වගේම අපට උගන්වන ගුරුවරයාය. පරමාත්ම ජීවය ඔබට උගන්වනවා. ලෞකික අධ්‍යයනයක්ද ශරීරයක් තුළින් උගන්වන්නේ ජීවාත්මයකි. කෙසේවෙතත්, එම ජීවාත්මය සහ සිරුර යන දෙකම අපවිත්‍රයි. ඔවුන් අපායේ වැසියන් බව, ලෝකයේ මිනිසුන් නොදනී. ඔබට දැන් ආපසු ඔබගේ නිවහනට යාමට තිබෙන බව, ඔබට වැටහෙයි. මෙය ඔබගේ නිවහන නොවෙයි. මෙය රාවනගේ විදෙස් නිවසයි. ඔබගේ දේශයේ සතුට බොහෝ තිබේ. ඔවුන් සිටින්නේ විදේශයක බව කොංග්‍රස් පක්ෂය සිතන්නේ නැහැ. පෙර කල ඔබ සිටියේ මුස්ලිම්වරුන්ගේ රාජධානියේ වන අතර ඉන්පසුව ක්‍රිස්තියානුවන්ගේ රාජධානියේ. දැන් ඔබගේම රාජධානියට ඔබ යන බව, ඔබ දන්නවා. පෙර, රාවනගේ රාජධානිය ඔබගේ රාජධානිය බව ඔබ සැලකුවා. ඔබ ආරම්භයේ සිටියේ රාමාගේ (දෙවියන්ගේ) රාජධානියේ බව ඔබට අමතක විය. පසුව උපත් 84හි චක්‍රය වටා යන විට, ඔබ රාවනගේ දුක් රාජධානියට ඇතුළු විය. ඔබ විදෙස් රාජධානියක සිටින විට තිබෙන්නේ දුක පමණයි. මේ සියලුම දැනුම ඔබගේ ඇතුලාන්තයේ ඉස්මතු විය යුතුයි. ඔබට පියාව සිහිවෙයි, නමුත් ඔබ අනිවාර්යෙන් තිදෙනාම සිහිකළ යුතුයි. මෙම දැනුම ලබා ගත හැක්කේ මනුෂ්‍යයන්ට පමණයි සතුන් ඉගෙන ගන්නේ නැත. සත් යුගයේ නීතිඥයෙක් ආදිය වීමට අධ්‍යයනයක් නැති බවත්, ඔය දරුවන්ට වැටහෙයි. පියා මෙහිදී ඔබව සියලු සම්පත් වලින් පුරවන නමුත් ඔබගෙන් සියලු දෙනාම රජවරු වන්නේ නැත. එහිද ව්‍යාපාර තිබෙන නමුත් ඔබට බොහෝ ධනය තිබෙයි. එහි කිසිම පාඩුවක් විඳීම, නීතිය නොවෙයි. සොරකම් කිරීම, පහර දීම ආදිය එහි නැත. නාමයම වන්නේ දෙව්ලොවයි. ඔබ දිව්‍යලෝකයේ සිටි බවත් පුනර්භව ගැනීමේදි ඔබ පහළට පැමිණි බවත් ඔය දරුවන්ට දැන් මතක් වෙයි. පියා ඔය දරුවන්ට කතාව කියයි. උපත් 84ක් ගෙන නැති ජීවාත්මයන්ව මායා පරාජය කරයි. මායාගේ විශාල කුණාටු ඇති බව, පියා විස්තර කරයි. මායා බොහෝ දෙනෙක් පරාජය කිරීමට තැත් කරයි. ඔබ ඉදිරියට යත්ම, ඔබට මේ ගැන බොහෝ දැක ගැනීමට සහ අසන්නට ලැබෙයි. පියා ළඟ සියලු දෙනාගේ ඡායාරූප තිබුණේ නම්, බොහෝ දින පැමිණ, පියාට අයත් වී,

පසුව මායා ගිල දැමූ අයගේ විශ්මය, ඔහු ඔබට පෙන්වනු ඇත. ඔවුන් මියැදී මායාගේ පැත්තට ගියා. මෙහි, කෙනෙක් කායික වශයෙන් මිය ගිය විට, ඔහු මේ ලෝකයේ තවත් උපතක් ගනී. ඔබගේ සිරුර ඔබ අත්හල විට, ඔබ ගොස් බාබා සමඟ අසීමිත නිවහනේ වාසය කරයි. එහි, බාබා, මමා සහ දරුවන් සිටියි. පවුලක් සමන්විත වන්නේ මේ අයගෙන්ය. පරම දනව්වේ, පියා සහ සහෝදරයන් පමණක් සිටියි වෙනත් සබඳකමක් නැත. මෙහි, පියා, සහෝදරයන් සහ සහෝදරියන් සිටියි. පසුව, වර්ධනය සිදු වී නෑකම් වැඩි වන විට, බාප්පලා, මාමලා ආදින් සිටියි. මේ සංගම යුගයේ ඔබ අයත් වන්නේ ප්‍රජාපිතා බ්‍රහ්මාටයි, එබැවින් ඔබ සහෝදර සහෝදරියන්ය. ඔබ ශිව බාබා සිහි කරන විට, ඔබ සහෝදරයන්ය. ඔබ මේ සියලුම දේවල් ඉතා හොඳින් මතකයේ තබා ගත යුතුයි. පියා අඛණ්ඩව ඔබට විස්තර කරන දේවල් ඔය දරුවන්ගෙන් බොහෝ දෙනෙකුට අමතක වෙයි. පියාගේ වගකීම වන්නේ ඔහුගේ දරුවන්ව තම හිස මත තැබීමය (තම දරුවන්ව ඔහුටත් වඩා උසස් බවට පත් කිරීමය). මේ නිසයි ඔහු නොකඩවා ඔබට නමස්කාර වේවා කියන්නේ. ඔහු අරුතද විස්තර කරයි. භක්ති මාර්ගයේ පූජකයන් සහ තාපසයන් ආදීන්ට, ඔබට ජීවන-මුක්තියට මාර්ගය පෙන්විය නොහැක. ඔවුන් විමුක්තිය ලබා ගැනීමට නොකඩවා උත්සාහ දරයි. ඔවුන් අයත් වන්නේ හුදකලා මාවතටයි. ඔවුන් රාජයෝගාව උගන්වන්නේ කෙසේද? රාජයෝගාව තිබෙන්නේ, ගෘහහස්ථ මාවතටයි. භක්තියේ, ප්‍රජාපිතා බ්‍රහ්මාව පෙන්වන්නේ අත් සතරක් ඇතිවයි. ඉන් කියැවෙන්නේද මෙය ගෘහ මාවතක් බවයි. පියා මෙම කෙනාව දරුකමට හදාගෙන ඇත. එබැවින් බ්‍රහ්මා සහ සරස්වතී යන නම් දී ඇත. නාටකයේ නියම වී ඇත්තේ කුමක්ද කියා ටිකක් බලන්න! මිනිසුන් 60වන වියේදී තම විශ්‍රාමික අවදියට ළඟා වී ගුරු කෙනෙක් අරගනී. පියා මෙම කෙනාගේ වයස 60ක් වූ විට, ඔහු තුළට ඇතුළු වී, පියා, ගුරුවරයා සහ ගුරු විය. මෙකල චාරිත්‍ර තවත් නරක් වී ඇත කුඩා දරුවන්ට පවා ගුරුන් හදා ගැනීමට සලස්වයි. එම කෙනා, ඔය ජීවාත්මයන්ගේ පියා, ගුරුවරයා සහ සත්ගුරු වන, අශාරීරික ඒකායන කෙනාය. අශාරීරික ලෝකය, ජීවාත්මයන්ගේ ලෝකය ලෙසද හැඳින්වෙයි. එම ලෝකය නොපවතින බව ඔබ නොකියයි. ජීවාත්ම වාසය කරන සාම දේශය ලෙසද එය හැඳින්වෙයි. පරමාත්ම ජීවයට නමක්, ස්වරූපයක් හෝ කාල වකවානුවක් නොමැති බව ඔවුන් පවසන්නේ නම්, ඔහුගේ දරුවන් පැමිණෙන්නේ කොහේ සිටද? ලෝක ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් ඒ ආකාරයෙන්ම සිදුවන අන්දම ගැන ඔය දරුවන්ට දැන් වැටහෙයි. ඉතිහාසය යනු ජීවත් වූ අය පිළිබඳ වන අතර භූගෝලය අජීවී දේවල් ගැනයි. ඔබ කෙතරම් කාලයක් ඔබගේ රාජධානිය පාලනය කළාද කියා, ඔය ජීවාත්ම දන්නවා. කතා පුවතක් ලෙස හැඳින්වෙන ඉතිහාසය, සිහි කරයි. භූගෝලය සාමාන්‍යයෙන් රටක් ගැනයි. රාජධානියක් පාලනය කරන්නේ ජීවමාන ජීවයි අජීවී කිසිවකට පාලනය කළ නොහැක. ඉතිහාසයෙන් කියැවෙන්නේ කෙනෙකුගේ රාජධානිය කෙතරම් කාලයක් පැවතුනේද සහ භාරතය ක්‍රිස්තියානුවන් විසින් කවදා සිට කවදා තෙක් පාලනය වූයේද ගැනයි. මේ ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය ගැන කිසිවෙකු නොදනී. ස්වර්ණමය යුගය වසර සිය දහස් ගණනකට පෙර පැවති බව ඔවුන් පවසන නමුත් එවිට පාලනය කළේ කවුරුන්ද හෝ ඔවුන් කෙතරම් පාලනය කළේද කියා ඔවුන්ගෙන් කිසිවෙකු නොදනී. එය ඉතිහාසය ලෙස හැඳින්වෙයි. ජීවාත්ම සජීවී වන අතර ශරීර අජීවිය. මුළු නාටකයම සජීවී සහ අජීවී දේ ගැනයි. මනුෂ්‍ය උපතක් උසස්ම බව සැලකෙයි. මනුෂ්‍යයන්ගේ සංගණනයක් තිබේ සත්වයින් කොපමණ සිටින්නේද කියා කිසිවෙකුට ගණන් කළ නොහැක. මුළු නාටකයම ඔබ ගැනයි. මෙම ඉතිහාසය සහ භූගෝලයට සවන් දෙන අය ඔබලාය. පියා මෙම කෙනා තුළට ඇතුළු වී සෑම දෙයක්ම ඔබට පහදා දෙයි. මෙය අසීමිත ඉතිහාසය සහ භූගෝලය ලෙස හැඳින්වෙයි. ඔබ එතරම් අනුවණ වූයේ ඔබට මෙම ඥානය නොතිබුණු නිසාය! මනුෂ්‍යයන්, ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නොදන්නේ නම්, එවන් මනුෂ්‍යයන්ගෙන් ඇති ඵලය කුමක්ද? ඔබ දැන් පියාගෙන් ලෝකයේ ඉතිහාසය සහ භූගෝලයට සවන් දෙනවා. මෙම අධ්‍යයනය ඉතා හොඳයි. මෙය උගන්වන්නේ කවුරුන්ද? පියා. ඔබට උසස්ම තත්ත්වය හිමි කරගැනීමට මඟපාදන්නේ පියාය උසස්ම තත්ත්වය වන්නේ ලක්ෂ්මී සහ නාරායන්ගේ සහ ඔවුන් සමඟ දිව්‍යලෝකයේ වාසය කරන අයගේය. එහි නීතිඥයින් ආදිය නොමැත. එහි මිනිසුන් හදාරන්නේ කලාවන් පමණයි. ඔවුන් විවිධ කුසලතා හැදෑරුවේ නැත්නම්, ඔවුන් ගොඩනැගිලි ආදිය ඉදි කරන්නේ කෙසේද? ඔවුන් එකිනෙකාට කුසලතා උගන්වයි. එසේ නැත්නම්, එතරම් ගොඩනැගිලි ආදිය තනන්නේ කවුරුන්ද? ඒවා ඉබේටම ගොඩනැගෙන්නේ නැහැ. මේ සියලුම රහස්, ඔබ දරණ උත්සාහයට අනුව, අංක පිළිවෙලට, ඔය දරුවන්ගේ බුද්ධිය තුළ තිබෙයි. මෙම චක්‍රය නොකඩවා භ්‍රමණය වන බව ඔබට වැටහෙයි. ඔබ එතරම් කාල වකවානුවක් පාලනය කළ අතර ඉන්පසුව ඔබ රාවනගේ රාජධානියට ඇතුළු විය. ඔවුන් ඉන්නේ රාවනගේ රාජධානියේ බව, ලෝකයේ වෙනත් කිසිවෙකු නොදනී. ඔවුන් පවසන්නේ බාබා, අපව රාවනගේ රාජධානියෙන් නිදහස් කරන්න. කොංග්‍රස් පක්ෂය තමන්ව ක්‍රිස්තියානුවන්ගේ පාලනයෙන් නිදහස් කරගත්තා. ඔවුන් දැන් පවසන්නේ දෙවි පියාණෙනි, අපව නිදහස්

කරන්න! ඔබ මේ සියලු දේ සිහි කරනවාද? ඔවුන් මෙසේ පවසන්නේ මන්ද කියා, කිසිවෙකු නොදනී. රාවනගේ රාජධානිය මුළු ලෝකය පුරාම තිබෙන බව, ඔබ දැන් දන්නවා. ඔවුන්ට රාම රාජධානිය අවශ්‍ය බව සියලු දෙනාම පවසන නමුත්, ඔවුන්ව නිදහස් කරන්නේ කවුරුන්ද? දෙවි පියාණන් ඔවුන්ව නිදහස් කරගෙන, ඔවුන්ගේ මාර්ගෝපදේශකයා වී, ඔවුන්ව, ඔහුත් සමඟ ආපසු රැගෙන යනු ඇතැයි, ඔවුන් සිතයි. භාරත ජනතාවට එතරම් නුවණ නොමැත ඔවුන් සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන්ය. ඒ මිනිසුන්ට (ක්‍රිස්තියානුවන්) භාරතයේ ජනතාවට තරම් දුකක් හෝ එතරම් සතුටක් නොලැබෙයි. භාරත ජනතාව ප්‍රීතිමත්ම අය වන අතර පසුව වැඩියෙන්ම දුකට පත්වන්නේද ඔවුන්ය මෙම ගිණුම තිබේ. දැන් බොහෝ දුක තිබේ! ආගමික නැඹුරුවක් ඇති අය දෙවියන් සිහි කර මෙසේ පවසයි අහෝ දෙවි පියාණෙනි! විමුක්තිදායකයාණනි! ඔබගේ හදවත්ද පවසන්නේ බාබා, පැමිණ අපගේ දුක ඉවත් කර අපව සතුටු දේශයට ගෙන යන්න! ඔවුන් පවසන්නේ අපව සාම දේශයට ගෙන යන්න! ඔබ පවසන්නේ අපව සාම දේශයට සහ සතුටු දේශයට ගෙන යන්න! දැන් පියා පැමිණ ඇති බැවින් ඔබ බොහෝ සතුටු විය යුතුයි. භක්ති මාර්ගයේ, දෙසවණට බොහෝ මිහිරියාවක් තිබේ. එහි තිබෙන සත්‍යයේ ප්‍රමාණය හරියට, පිටි ගෝනියක ඇති ලුණු පිංචක් වැනිය. චන්දිකා දේවතාවියට (ආදාහන සිදුකරන දේවතාවිය) ඔවුන් මේලාවක් පවත්වයි. දැන් බලන්න, ආදාහනය සිදුකරන්නන්ට මේලාවක් තිබෙන්නේ ඇයි? ආදාහන සිදුකරන්නෙක් ලෙස හැඳින්වෙන්නේ කවරෙක්ද? බාබා පවසා තිබෙන්නේ, එහි ආදාහන සිදු කරන අය ලෙස උපත ලබන්නේ, මෙහි සිටින අය බවයි. ඔවුන් මෙහි වාසය කරයි, ඔවුන් මෙහි කමින් බොමින් හිඳ, යමක් දී, පසුව පවසන්නේ අප දී ඇති සෑම දෙයක්ම අපට ආපසු දෙන්න. අප මෙය විශ්වාස නොකරන අතර අපට සැක තිබේ. සැක තිබෙන එවන් ජීවාත්ම, කවුරුන් බවට පත් වෙයිද? එවැනි චන්දිකාවකට මේලාවක් පවත්වයි. අඩු තරමින් ඔවුන් ස්වර්ණමය යුගයට යයි. ඔවුන් අඩු තරමින් ටික කාලයකට හෝ උදව්කරුවන් වන්නේ නම්, ඔවුන්ට දිව්‍යලෝකයට යා හැක. ඒ බැතිමතුන් මේ කිසිවක් ගැන නොදනී. ඔවුන්ගෙන් කිසිවෙකුට ඥානය නොමැත. පිංතූර ඇති ගීතාවකින් මිනිසුන් බොහෝ මුදල් උපයයි. මෙකල සෑම කෙනෙක්ම පිංතූර වලට බොහෝ ප්‍රිය කරයි. ඔවුන් එය කලාව බව සලකයි. දේවතාවන්ගේ පිංතූර කෙසේ විය යුතුද කියා, මනුෂ්‍යයන් දන්නේ කෙසේද? ඔබ ආරම්භයේ අංක එකට සිටියා. ඉන්පසුව ඔබ කවුරුන් බවට පත්වුනාද? එහි අන්ධයින් හෝ එක ඇසක් ඇති අය කිසිවෙකු නොසිටියි. දේවතාවන්ට ස්වභාවික සුන්දරත්වය තිබේ එහි ස්වභාවික සුන්දරත්වය තිබේ. පියා සෑම දෙයක්ම විස්තර කර දී මෙහෙමත් කියයි දරුවනේ, පියාව සිහි කරන්න! පියා, පියාණන්, ගුරුවරයා සහ සත්ගුරුය. ඔහුව ස්වරූප තුනෙන්ම සිහි කරන්න, එවිට ඔබට උරුම තුනම ලැබෙයි. අවසානයේ පැමිණෙන අයට, ඔහුව තුන් ආකාරයෙන්ම සිහි කිරීමට නොහැකි වෙයි. ඔවුන් මුක්තියට යයි. සූක්ෂම කලාපය තිබෙන්නේ දර්ශන වලට පමණක් බවත් මුළු ඉතිහාසය සහ භූගෝලයම සිදු වන්නේ මෙහි බවත් බාබා පවසා තිබේ. එය කෙතරම් කාලයක් පවතින්නේද කියා කිසිවෙක් නොදනී. පියා දැන් ඔය දරුවන්ට එය පවසා ඇති බැවින් ඔබට දැන් එය ඕනෑම කෙනෙකුට පැවසිය හැක. ප්‍රථමයෙන් ඔබ පියාගේ හැඳින්වීම ලබා දිය යුතුයි. ඔහු අසීමිත පියාය. පරමාත්මයයි. ලෞකික පියෙක් කිසිදා පරම පියා හෝ පරමාත්මය ලෙස හැඳින්වෙන්නේ නැහැ. පරම වන්නේ එක්කෙනෙක් පමණක් වන අතර ඔහු දෙවියන් ලෙස හැඳින්වෙයි. ඔහු දැනුමින් පිරිපුන්ය, එබැවින් ඔහු ඔබට දැනුම උගන්වයි. මෙම දේවමය ඥානය ඔබගේ ආදායම් මාර්ගයයි. දැනුමද උසස් මට්ටමක, මධ්‍යම මට්ටමක හෝ පහත් මට්ටමක තිබෙයි. පියා උසස්ම උසස් බැවින් ඉගෙනුමද උසස්ම උසස්ය. තත්ත්වයද උසස්ය. ඉතිහාසය සහ භූගෝලය පිළිබඳව ඔබ විගසින් දැනගන්නා නමුත් සිහි කිරීමේ වන්දනා ගමනේ ඔබ සටන් කළ යුතුයි. ඔබ මෙයින් පරාජය වන්නේ නම්, ඔබ දැනුමින්ද පරාජය වෙයි. ඔබ පරාජය වී මෙහෙන් පැන යන්නේ නම්, ඔබ මෙම දැනුමින්ද පැන යයි. එසේ වන්නේ නම් ඔබ පෙර සිටි ආකාරයට පත් වන්නේ නැහැ, ඔබ ඊටත් වඩා නරක වෙයි. ඔබගේ හැසිරීම තුළින් පියාට ඔබගේ ශරීර අවධානය ඉතා විගසින් දිස්වෙයි. බ්‍රහ්මනයන්ගේ මාලාවද තිබෙන නමුත්, අංක පිළිවෙලට ඔවුන්ට මෙහි අසුන් ගැනීමට හැකි වන්නේ කෙසේද කියා බොහෝ දෙනෙක් නොදනී ඔවුන්ට ශරීර අවධානය තිබේ. විශ්වාසය ඇති අය අනිවාර්යෙන් බොහෝ සතුට අත්විඳියි. තම සිරුර අත්හල විට, ඔබ රජකුමරෙක් වෙයි යන විශ්වාසය තිබෙන්නේ කාටද? (සියලු දෙනාම අත් එසවීය). දරුවන්ට බොහෝ සතුට තිබේ! ඔබ සියලු දෙනාටම මෙම විශ්වාසය තිබෙන නිසා, ඔබ සියලු දෙනාටම දිව්‍යමය ගුණදම්ද තිබිය යුතුයි. ඔබගේ බුද්ධිය තුළ විශ්වාසය තිබීම යනු, ජයග්‍රාහී මාලාවේ ඇමිණීම වන අතර තවද ඉන් අදහස් වන්නේ අධිරාජයෙක් වීමය. විදේශිකයන් අන් සියලුම වන්දනා ස්ථාන වලට යෑම නතර කර, වැඩිපුර අබූ කන්දට පැමිණෙන දිනයද පැමිණෙයි. ඔවුන්ට භාරතයේ රාජයෝගාව හැදෑරීමට අවශ්‍යයි. එම පාරාදීසිය නිර්මාණය කළේ කවුද? උත්සාහ දැරීම සිදුවන අතර, පෙර චක්‍රයේ එය සිදු වූයේ නම්, කලාගාර අනිවාර්යෙන් විවෘත වෙයි. ඔබට එවන් ස්ථිර ප්‍රදර්ශනයක් පැවැත්වීමට

අවශ්‍ය බවත්, එබැවින් ඔබට ගොඩනැගිල්ලට වසර හතරක හෝ පහක බද්දක් ගැනීමට හැකිද කියා, ඔබ විමසිය යුතුයි. ඔබ භාරතයට සේවය කරන්නේ, එය සතුටු දේශය බවට පත් කරවීමටයි. මෙය මඟින් බොහෝ දෙනෙකුට යහපතක් සිදුවෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අසීමිත සතුටින් සිටීම සඳහා, පියාම ඔබව සරසවන බවත්, ඔහු ඔබට අසීමිත ධනය ලබා දෙන බවත් අවධානයේ තබා ගන්න. ඔබ ඉගෙන ගන්නේ, නව ලෝකයට, අමරණීය දේශයටයි.
2. තමන්ව ජයග්‍රාහී මාලාවේ අමුණා ගැනීම සඳහා ඔබගේ බුද්ධිය විශ්වසනීයව තබාගෙන, දිව්‍යමය ගුණදම් ධාරණය කරගන්න. ඔබ දී ඇති දේ, ආපසු ගැනීමට කිසිම විටෙක නොසිතන්න. කිසිම විටෙක ඔබගේ බුද්ධියට සැක උපදවා ඒ අනුව ඔබගේ තත්ත්වය අහිමි කර ගැනීමට ඉඩ නොදෙන්න.

**වරදානය:** ඔබ ක්‍රෝධයෙන් පිරි ජීවාත්ම දයාව නමැති සිහිල් ජලයෙන් සද්ගුණවත් භාවයට පත් කරන ආශිර්වාදාත්මක ජීවාත්මයක් වේවා.
කෝපයෙන් දැවෙන කෙනෙකු ඔබට අපහාස කිරීමට හා අපකීර්තියට පත් කිරීමට ඔබ ඉදිරියට එන විට, ඔබේ යහපත් ප්‍රාර්ථනාවෙන් සහ පිරිසිදු හැඟීම් වලින්, ඔබේ ආකල්පයෙන් සහ අවස්ථාවෙන්, එම ආත්මයට ඉවසීමේ ගුණයෙන් හා බලයෙන් ආශිර්වාද කරන්න. කෝපයට පත් ජීවාත්ම බාහිර බලපෑමට යටත් වන අතර, කරුණාවේ සිසිල් ජලයෙන් එවැනි ජීවාත්ම සාමකාමී කරයි. ආශිර්වාදාත්මක ජීවාත්ම වන ඔබගේ යුතුකම මෙයයි. ඔබ ජීවමානව මෙබඳු සංස්කාරයන්ගෙන් පිරී සිටින නිසා ඔබේ බැතිමතුන්ට ඔබේ අජීවී රූප වලින් මෙබඳු ආනිශංස ලැබේ.

**පාඨය:** සිහිකිරීමෙන් සියලු බලවල නිධානය අත්විඳින අය සියලු බලයෙන් පිරී යයි.

***** ඕම් ශාන්ති *****